**ඇමුණුම 01**

# "ජන සභා"

*රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරනු පිණිස*

*'ජනසභා' ගොඩනැගීමේ වැඩපිළිවෙල පිළිබඳව වන යෝජනාව*



**සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය**

*සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය විසින් මේ වනවිට ගරු ජනාධිපතිතුමන් වෙත ඉදිරිපත් කර තිබෙන* **'ජනසභා' පිළිබඳ මූලික සංකල්ප පත්‍රිකාව** *පදනම් කරගෙන පසුගිය සති කිහිපයක කාලය තුළ සිදුකරන ලද විද්වත් සාකච්ඡා මත පදනම්ව වැඩිදියුණු කරන ලද ලියවිල්ලක් ලෙස මෙම පත්‍රිකාව ඉදිරිපත් කරනු ලබයි. මේ මගින් කඩිනමින් 'ජනසභා' ක්‍රමයක් ස්ථාපනය කිරීම පිළිබඳව වඩා ප්‍රයෝගික අදහසක් ඉදිරිපත් කර තිබෙන අතර මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම මගින් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සක්‍රීය ප්‍රජා පුරවැසි සහභාගීත්වයක් තහවුරු කරගැනීමට හැකියාව ලැබෙනු ඇත.*

## 1. පූර්විකාව

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතන ව්‍යුහය නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම සඳහාත් නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය මගින් ජනතා පරමාධිපත්‍ය ක්‍රියාත්මක කිරීම සඳහාත් ස්ථාපනය කර ඇත. මෙම ව්‍යුහයන්ට පරිබාහිරව සක්‍රීය ජනතා සහභාගීත්වයක් තහවුරු කෙරෙන සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතියක් අවශ්‍ය වන බවට කතිකාව මෑත කාලීනව අපට දක්නට ලැබිණ. මෙහිදී ප්‍රධාන වශයෙන් ගම පිළිබඳව තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ පරිධියේ ජනතාවගේ සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කෙරෙන ප්‍රතිසංස්කරණයන් පිළිබඳව නිදහසින් පසු වසර ගණනාවක් පුරා විවිධ අවස්ථාවල සාකච්ඡා කර ඇත. ඒ පිළිබඳව විවිධ පර්යේෂණ, විවිධ අත්හදා බැලීම් සහ උත්සාහයන් පවා සිදුකර ඇත. 'ජනසභා' එසේත් නොමැතිනම් 'මහජන කවුන්සිල' පිළිබඳව මාධ්‍ය සහ පොදුජන අවධානය නැවත ඉස්මතු වූයේ 2022 වසරේ ජන අරගලය තුළ එම කරුණ සාකච්ඡාවට බඳුන්වීමත් සමගය. මෙම ජනසභා ක්‍රමය පිළිබඳව සාකච්ඡා කරනවිට ශ්‍රී ලංකාවේ අතීත ගම්සභා ක්‍රමයත් ඉන් පසුව ක්‍රමිකව වර්ධනය වූ පළාත් පාලන ව්‍යුහය පිළිබඳවත් අවධානය යොමු කල යුතුය.

ශ්‍රී ලංකාවේ ගම්සභා ක්‍රමයේ ඉතිහාසය පණ්ඩුකාභය රජ දවස දක්වා දිවෙන්නක් බව ඉතිහාස මූලාශ්‍ර අධ්‍යයනය කිරීමේ දී පෙනී යයි. වසර 2000 කට වැඩි ඉතිහාසයක් සහිතව පැවත ආ ගම්සභා ක්‍රමය පිළිබඳව විධිමත් අධ්‍යයනයන් සිදු කරන ලද ආචාර්ය මාලිනී ඇඳගම පවසන පරිදි වඩා දියුණු ශිෂ්ඨාචාරයක ලක්ෂණ සහිත විධිමත් ගම්සභා ක්‍රමයක් ශ්‍රීලංකාවේ ඉතිහාසය පිරික්සීමේ දී හමුවෙයි. රටේ පරිපාලන ව්‍යුහය තුළ ගම්සභා ක්‍රමය පුළුල්ව පැවති බව දිවයිනේ විවිධ ප්‍රදේශවලින් හමුවී ඇති ශිලා ලේඛණ මගින් තහවුරු වන බව 1955 දී පළාත් පාලනය පිළිබඳව පත් කරන ලද චොක්සි කොමිසමේ වාර්තාව මගින් ද කරුණු දක්වන අතර එහි වැඩිදුරටත් මෙසේ සඳහන් වේ. "රට පුරාම ගම් සභා ක්‍රමය පැවති බවට නිදාසුනක් වශයෙන් ඌව පළාතේ දොඹගහවෙල, රුහුණු ජාතික උද්‍යානය, කුරුනෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව සහ හොරොව්පතාන වැනි දිවයිනේ විවිධ ප්‍රදේශවලට සම්බන්ධ ශිලා ලේඛණ සාක්ෂි දරන බව පෙනී යයි" [1]

ශ්‍රී ලංකාවේ පැවති ගම්සභා ක්‍රමය සක්‍රීය ප්‍රජා සහභාගීත්වයක් සහිතව පැවති ක්‍රමයක් බව පෙනී යන නමුත් ඒ තුළ සමාජ සම්මුතියක් පැවතුනත් පුළුල් ප්‍රජාතන්ත්‍රවාදයක් අභ්‍යාස නොවුන බවට තර්ක ඉදිරිපත්ව ඇත. විශේෂයෙන් ප්‍රභූවාදය ක්‍රියාත්මකවීම මත යම්කිසි අධිපති ආධිපත්‍යයක් ඒ තුළ දක්නට වූ බවට ඇතැම් ලක්ෂණ සාක්ෂි දරයි. මේ නිසා ස්ත්‍රීන්, තරුණයින් වැනි කොටස් ද වාර්ගිකත්වය සහ කුලය මත සුළුතරය වූ කොටස් ද සමානාත්මතාවයෙන් යුතුව සලකන ලද්දේ ද යන්න පිළිබඳ ගැටලුකාරීතත්වයන් ඇත.

---

[1] පළාත් පාලනය පිළිබඳ කොමිෂන් සභා වාර්තාව -1955 (චොක්සි කොමිෂන් වාර්තාව) පිටු.1,2 විසින් උපුටා දක්වන ලද ශ්‍රී ලංකාවේ පළාත් පාලනය සහ විමධ්‍යගතකරණ පරිපාලනය - ලීටන්, ට්‍රේසි ජී.ආර්. 1979

බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ලංකාවේ පැවති ගම්සභා ක්‍රමය වෙනුවට පළාත් පාලන ව්‍යුහයක් ලෙස ගම් කාරක සභා හඳුන්වා දෙන අතර ඉන් පසුව ක්‍රමයෙන් මහනගර සභා සනීපාරක්ෂක මණ්ඩල සුළු නගර සභා වැනි පළාත් පාලන ව්‍යුහයන් හඳුන්වා දෙන ලදී.

1947 න් පසුව පවා පළාත් පාලනය තුළ සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් තහවුරු කිරීම, පළාත් පාලනය තුළ මූල්‍ය ස්ථාවරත්වය ඇති කිරීම වැනි කරුණු පිළිබඳව සාකච්ඡා කර ඇත. ඒ සම්බන්ධව 1955 චොක්සි කමිටු වාර්තාව, 1968 ජයසූරිය කමිටු වාර්තාව,1970 සිත්තම්පලම් කමිටු වාර්තාව, 1979 මොරගොඩ කමිටු වාර්තාව සහ 1980 වික්ටර් තෙන්නකෝන් කමිටු වාර්තාවත් 1986 එච්.ඒ.පී අබේවර්ධන කමිටු වාර්තාවත් අධ්‍යයනය කිරීමෙන් වැඩිදුර තොරතුරු ලබා ගත හැක. එමෙන්ම අතීත ගම්සභා ක්‍රමයත් බ්‍රිතාන්‍ය යුගයේ සහ පශ්චාත් නිදහස් අවධියේ පළාත් පාලනයත් අධ්‍යයනය කරමින් ශ්‍රී ලංකාවේ පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳව සිදු කරන ලද 1999 ජනාධිපති කොමිෂන් සභා වාර්තාව තුළත් සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය වර්ධනය කිරීම සඳහා කටයුතු කිරීමේ වැදගත්කම ඉස්මතු කර තිබේ.

මේ අතරින් සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම සඳහා ගන්නා ලද වැදගත් උත්සහයක් වන්නේ 1981 ජූලි මස 01 වනදා ආරම්භ කරන ලද දිස්ත්‍රික් සංවර්ධන සභා හඳුන්වා දුන් දිස්ත්‍රික් සංවර්ධන සභා පනතයි. එම පනතේ 17 වන වගන්තිය මගින් ග්‍රාමෝදය මණ්ඩල හඳුන්වා දෙන ලදී. 'බිම් මට්ටමේ ජනතාවගේ සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා සංවර්ධන සභාවලට අතිරේකව ප්‍රාදේශීය මණ්ඩල සහ ග්‍රාමෝදය මණ්ඩල පිහිටුවන ලදී' [2]

එමෙන්ම 2016 වසරේ දී එළිදක්වන ලද 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳව මහජන අදහස් විමසීමේ කමිටු වාර්තාව මගින් ද ග්‍රාම රාජ්‍ය / ග්‍රාම සභා සංකල්පය පිළිබඳව සාකච්ඡා කර ඇත. එම කමිටු වාර්තාවේ 10.1.2 යටතේ මෙසේ දක්වා තිබේ. "ගම් මට්ටමට බලය ලබා දීම අවශ්‍යව ඇත්තේ ගම් මට්ටමේ පාලනයේ දුර්වලතා මග හරවා ගැනීමටත්, ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ව්‍යුහය තුළ පුරවැසියන්ගේ ඍජු සහභාගීත්වය වැඩි කිරීම සහතික කිරීමත් සඳහා ය. ගැමියන්ගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීමේ අරමුණ ළඟා කරගැනීම සඳහා තීරණ ගැනීමේ දී පුරවැසියන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ලබා ගනිමින් ගම් මට්ටමේ කටයුතු කළමනාකරණය සඳහා වූ ස්වයං පාලන ආයතනික යාන්ත්‍රණයක් ව්‍යවස්ථානුකූලව ස්ථාපිත කිරීම යෝජිත පද්ධතියේ අරමුණ වේ. මෙවැනි නව දේශපාලන ව්‍යුහයක් අවශ්‍යවී ඇත්තේ, සියලු මට්ටම්වල දේශපාලනඥයින් හා නිලධාරීන් ට බලය අවභාවිතා කිරීමට තුඩු දෙන පක්ෂ දේශපාලනයේ ඇති දූෂණය හා ප්‍රාදේශීය දේශපාලනයේ දැකිය හැකි අන්තවාදී දේශපාලනීකරණය හා නිලධාරීවාදය නිසාය" [3]

---

[2]ශ්‍රීලාංකීය සමාජයේ සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය කරා පළාත් පාලන ක්‍රමය පිළිබඳ දළ විශ්ලේෂණයක් - ශෝක්මන් ඉවෝන්, මාර්ග - 2011

[3]ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටු වාර්තාව - 2016 (ලාල් විජේනායක කමිටු වාර්තාව)

මෙම කමිටු වාර්තාව මගින් ගම් සභාව පිළිබඳව ප්‍රධාන මූලධර්ම කිහිපයක් ඔස්සේ සාකච්ඡා කර ඇත. එනම්, ගම්මට්ටමේ ප්‍රජා සංවිධාන සාමාජිකයින්ගේ ග්‍රාම රාජ්‍ය, අනුපූරකතාව පිළිබඳ මූලධර්මය, බලය බෙදීමේ දෙවන ස්ථරය ලෙස පළාත් පාලන ආයතන සහ ග්‍රාම සභා සහ අනුපූරකතා මූල ධර්මයෙන් ඔබ්බට යමින් අව්‍යාජ පුරවැසි ප්‍රජාතන්ත්‍රවාදයක් පිහිටුවීම යන මූලධර්ම පිළිබඳවයි.

ඉහත කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ දැනට පවතින පළාත් පාලන ක්‍රමය තුළ සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් පවතින ඌණතාවය පිටුදැකීමටත් අතීත ගම්සභා ක්‍රමයට වඩා බොහෝ සෙයින් ඉදිරිගාමී ලක්ෂණ සහිතවත් ස්ථාපනය කල යුතු සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන නව ව්‍යුහයක් ලෙස, මෙම සංකල්ප පත්‍රිකාව මගින් ග්‍රාමීය ජන සභා යෝජනා කර සිටියි. මෙමගින් ගම තුළ පුළුල් සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදයක් තහවුරු කිරීමටත් පරිධියේ ජනතාව වෙත පාලනය තුළට ප්‍රවිෂ්ඨ වීමට අවස්ථාව උදා කර දීමටත් හැකි වනු ඇත. එමෙන්ම මේ තුළින් ජාතික මට්ටම සඳහා ද සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන, දැනට පවතින ව්‍යවස්ථාදායක සඳහා නිරීක්ෂණ සහ මහජන අදහස් ලබා දෙන මණ්ඩලයක් ලෙස ක්‍රියා කල හැකි නව ව්‍යුහයන් යෝජනා කර ඇත. එමෙන්ම සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් පිටු දැකීමටත් ජන වාර්ගිකත්වය, ආගමිකත්වය කුලය වැනි සාධක මත කිසිවෙකුත් බැහැර නොවන ප්‍රමාණවත් නියෝජනයක් තහවුරු කරන ක්‍රමවේද හඳුන්වා දීමටත් ප්‍රභුවාදය ක්‍රියාත්මක වීම මත සාධාරණ ඉඩ ප්‍රස්ථා ඇහිරීම වැළැක්වීමටත් මෙම යෝජනාවලිය මගින් අවධානය යොමු කර ඇත. එමෙන්ම තරුණ සහ කාන්තා නියෝජනයන් ප්‍රමාණවත් පරිදි තහවුරු කිරීමටත් මෙම සංකල්ප පත්‍රිකාව මගින් වැඩි දුරටත් අවධානය යොමු කර ඇත.

## 2. ජනසභාව කා සඳහා ද ?

ජනසභාව මේ රටේ ජීවත්වන සෑම ශ්‍රීලාංකිකයකු වෙනුවෙන්ය. විශේෂයෙන් පරිධියට බොහෝ සෙයින් දුරස්ථ ඈත ගම නියම ගම වල ජීවත්වන මිනිසුන්ගේ හඬ පාලනයට හවුල් කරගැනීම සඳහා මේ යටතේ සක්‍රීය මැදිහත්වීමක් ලැබෙනු ඇති බව විශ්වාස කරමු. එමෙන්ම සෑම ග්‍රාමසේවා වසමකම රාජ්‍ය ප්‍රතිපත්ති මත ජනරජයේ රාජ්‍යකරණය ක්‍රියාත්මක කිරීමේ දී ඒ සඳහා සක්‍රීය ප්‍රජා පුරවැසි සහභාගීත්වයක් තහවුරු කිරීමට මෙය මහත් පිටුබලයක් සපයනු ඇත. එමෙන්ම ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව මහජනතාව නිරතුරුව අවධියෙන් තබන යාන්ත්‍රණයක් ලෙස ද මෙය ක්‍රියාත්මක වනු ඇත. වැඩිදුරටත් පෙන්වා දිය හැක්කේ ජනතාව ගේ ඍජු සහභාගීත්වය තුළින් ගමේ ප්‍රශ්න සහ ගමට අදාළ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර ගැනීමටත් ජාතික තලයේ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ජනතා අදහස් සක්‍රීය ලෙස ලබාගැනීමටත් යාන්ත්‍රණයක් මේ යටතේ උදා වනු ඇති බවයි.

## 3. වැඩසටහනේ යුක්ති යුක්තභාවය

දැනට නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන බල ව්‍යුහයන් කිහිපයක් පවතින තත්වයක් තුළ මෙලෙස තවත් සහභාගීත්ව ආකෘතියක් කුමකට ද යන ප්‍රශ්නය ඇතැම් පාර්ශවයන් වෙතින් නැගෙනු දක්නට ඇත. නමුත් මෑතක දී මහජන නැගිටීම් වල දී මතුවූ ප්‍රධාන ඉල්ලීමක් වූයේ ද නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී ආකෘති වලට සමගාමී වශයෙන් ක්‍රියාත්මක වන ජනතාවගේ සැබෑ හඬට වේදිකාවක් තැනෙන සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතියක් අත්‍යවශ්‍ය වන බවයි. එම සන්දර්භය තුළ 'ජනසභා' පිළිබඳව සංකල්පය මතුවන්නේ ජනතාවගේ සැබෑ හඬ රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය සඳහා දායක කරගැනීමටත් එම ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ දී සක්‍රීය ප්‍රජා පුරවැසි සහභාගීත්වයක් ලබා ගැනීම තුළින් එකී ප්‍රතිපත්ති සාර්ථක කරගැනීමටත් අවශ්‍ය යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමේ අරමුණෙනි.

## 4. දැක්ම

දියුණු සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදයක් තුළින් තිරසර රාජ්‍යයක් නිර්මාණය කිරීම

## 5. මෙහෙවර

දකුණු ආසියාවේ වඩාත්ම සක්‍රීය සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතිය බවට ජනසභා පත් කිරීම තුළින් ශ්‍රීලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා මෙන්ම රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහි ලා ප්‍රශස්ත පුරවැසි මැදිහත්වීමක් තහවුරු කිරීමත් එතුලින් 2030 වසර වන විට දියුණු සවිඥානික පුරවැසියෙක් සහිත තිරසර රාජ්‍යයක් නිර්මාණය කිරීමටත් දායක වීම.

## 6. ඉලක්ක

1. පරිධියේ ජනතා අදහස් කේන්ද්‍රයේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සක්‍රීයව සම්බන්ධ කිරීම
2. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිලා සක්‍රීය ප්‍රජා පුරවැසි සහභාගීත්වයක් තහවුරු කිරීම
3. ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට දායක වන සක්‍රීය සහ දියණු පුරවැසියෙක් ගොඩනැගීම
4. සක්‍රීය පුරවැසි මැදිහත්වීමක් තුළින් නිලධාරීවාදයේ අකාර්යක්ෂමතා සහ දේශපාලන අධිකාරියේ මැදිහත්වීම මත සිදුවන නාස්තිය හා දූෂණය පිටුදැකීම
5. ජාතික වැදගත්කමකින් යුතු තීන්දු තීරණ ගැනීම සඳහා ජනතා සහභාගීත්වය ලබා ගැනීම
6. දැනට පවතින ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතීන්ගේ අකාර්යක්ෂමතා සක්‍රීය පුරවැසි සහභාගීත්වය තුළින් නිවැරදි කිරීම සඳහා තියුණු සහ දියුණු පුරවැසි  මැදිහත්වීමක් සහිත සහභාගීත්ව ව්‍යුහය ලෙස ජනසභා ගොඩනැගීම.

## 7. මෙම ව්‍යාපෘතිය මගින් යෝජනා කරන මූලිකාංග

1. ජාතික ජනසභා ලේකම් කාර්යාලය
2. ග්‍රාමීය ජනසභාව
3. ප්‍රාදේශීය ජනසභා කළමනාකරණ කමිටුව
4. ජාතික මහජන සභාව

## 8. ජාතික ජන සභා ලේකම් කාර්යාලය

- ජාතික ජන සභා ලේකම්කාර්යාලය ජනසභා ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ වැඩිදියුණු කිරීම යන ක්‍රියාමාර්ග සඳහා වගකීම දරන ප්‍රධාන ආයතනය වේ.

- සම්පූර්ණයෙන් ස්වාධීන ආයතනයක් ලෙස ස්ථාපනය කිරීමට යෝජනා කරනු ලබයි.

- මෙම ආයතනය විසින් ජනාධිපති කාර්යාලය සහ පාර්ලිමේන්තුව අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යනු ලැබිය යුතුය.

- සියලුම ග්‍රාමීය ජන සභා ලේකම්වරුන් අධීක්ෂණය, සුපරීක්ෂණය සහ පුහුණුව පිළිබඳව වගකීම දරන ආයතනය වේ.

- මෙම ආයතනය පිළිබඳව වැඩි දුර විස්තර මෙම සංකල්ප පත්‍රිකාව අවසානයේ දක්වා ඇත.

## 9. ග්‍රාමීය ජන සභාව

**අරමුණ**

ග්‍රාමසේවා වසමක් තුළ ජීවත්වන ජනතාවට එක්ව තමන්ගේ ගමේ කටයුතු පිළිබඳව තීරණ ගැනීමට අවස්ථාව ලබා දීම ග්‍රාමීය ජන සභාව පිහිටුවීමේ මූලිකම අරමුණ වෙයි.

**ස්වභාවය**

සෑම ග්‍රාම සේවා වසමකටම එක් ග්‍රාමීය ජන සභාවක් පිහිටුවීමට අප යෝජනා කර සිටියි. මේ අනුව ආසන්න වශයෙන් පවුල් 500 කට එක ජන සභාවක් තහවුරු කිරීමට මෙමගින් අවස්ථාව ලැබෙනු ඇත.

එවිට ආසන්න වශයෙන් ග්‍රාමීය ජනසභා 14022 ක් පිහිටුවීමට සිදුවනු ඇත. නමුත් කොළඹ හා තදාසන්න ප්‍රදේශවල යම් ග්‍රාම සේවා වසමක අතිවිශාල පවුල් ප්‍රමාණයක් ජීවත්වන අවස්ථාවක සුදුසු පරිදි සභා කිහිපයක් එම ප්‍රදේශය සඳහා ස්ථාපනය කල යුතුය.

එලෙස වසමකට සභා කිහිපයක් පිහිටවිය යුතු අවස්ථාවක ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ නිර්දේශ සලකා බලා අදාළ සභා ප්‍රමාණය තීරණය කිරීමේ බලය ජාතික ජන සභා ලේකම්වරයා වෙත ලබා දීමට මෙමගින් යෝජනා කර සිටියි.

සෑම ග්‍රාම සේවා වසමකම ජන සභාව පවත්වාගෙන යාම සඳහා ජනසභා ලේකම්වරයෙක් සිටිය යුතුය. මේ සඳහා රජයේ දැනට බඳවාගෙන සිටින සංවර්ධන නිලධාරීවරයකු පත්කරනු ලැබිය යුතුය. එම නිලධාරියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කරන නමුත් ජාතික ජනසභා ලේකම් කාර්යාලයට වගකියන නිලධාරීයෙකු විය යුතුය. ඔහුගේ වගවීම ජාතික ජනසභා ලේකම්වරයා වෙත තිබිය යුතුය.

**සංයුතිය හා තෝරා ගැනීම**

ග්‍රාමීය ජන සභාව සඳහා වසමේ පදිංචි වයස අවුරුදු 16 ට වැඩි සියලු දෙනාට සහභාගීවිය හැකිය. එලෙස පවත්වනු ලබන ග්‍රාමීය ජන සභාවේ වසරේ පළමු මහසභා රැස්වීමේ දී සභාපතිවරයෙක් සහ කාරක සභාවක් පත්කර ගත යුතුය.

සභාපතිධූරය සඳහා ද හැකි සෑම විටම කාන්තාවක් සහ තරුණයෙක් පත්වීම දිරිමත් කල යුතුය.

එකම සභාපතිවරයකුට එක ළඟ දෙවතාවක් සභාපති තනතුරට පත්විය නොහැකිය. වරක් පත්වූ අයෙකුට නැවත පත්වීම සඳහා තරඟ කල හැක්කේ වසර දෙකකට පසුවය.

සභාපති ධූරය සඳහා ඒකමතික පත්වීමක් නොමැති අවස්ථා වල ඉදිරිපත්ව ඇති නාමයෝජනා අතුරින් අහඹු ලෙස නමක් තෝරා ගන්නා ලොතරැයි ක්‍රමයකට සභාපතිවරයා තෝරා ගත යුතුය.

කාරක සභාව සඳහා ජනතාව අතරින් උපරිම වශයෙන් 25 දෙනෙකු තෝරා ගත යුතුය. එලෙස තෝරා ගැනීම මහසභාව විසින් සාකච්ඡා කර එකඟතා ගොඩනගා ගැනීමේ පදනමින් සිදුකල යුතුය. එමෙන්ම කාරක සභාව සඳහා ජනතාව අතරින් තෝරා ගන්නා සාමාජිකයින්ගෙන් 30% ක් අවම වශයෙන් කාන්තාවන් විය යුතුය. 25% ක් අවම වශයෙන් තරුණයින් විය යුතුය.

එම ප්‍රදේශයේ ජාතීන් සහ ලබ්ධීන් බෙදී ඇති ආකාරය අනුව සුදුසු ප්‍රතිශතාත්මක නියෝජනයක් කාරක සභාව වෙත ලබා ගැනීම සඳහා ග්‍රාමීය ජනසභා ලේකම්වරයා මහ සභාව සමඟ සාකච්ඡා කර කටයුතු කල යුතුය.

සභාපති ඇතුළු පත්වන කාරක සභා සාමාජිකයින් ස්වේච්ඡා පදනමින් ධූරයන් දැරිය යුතුයි.
සභා කාලය වසරකි. එම කාලය අතර තුර හදිසි තත්ත්වයකදී ජනතා අදහස් විමසීමට ඕනෑම අවස්ථාවක මහසභා රැස්වීමක් කැඳවිය හැකිය.

කාරක සභාව සඳහා ජනතාව අතරින් තෝරා ගන්නා 25 දෙනාට අමතර වශයෙන් වසමට අදාළ රාජ්‍ය නිලධාරීන් සියලු දෙනා කාරක සභාවේ සාමාජිකයින් වෙයි. එහෙත් ඔවුන්ට සිදුකල හැක්කේ උපදේශනාත්මක කාර්යයන් පමණි. කිසියම් යෝජනාවක් සඳහා ඡන්ද අයිතිය හිමි නොවේ.

එමෙන්ම ජනතාව අතරින් තෝරා ගන්නා ලද 25 දෙනාට අයත් නොවන එහෙත් ක්‍රියාකාරීව ගමේ ස්වේච්ඡා කටයුතු සිදුකරන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි සමිතියක සභාපති තනතුරු දරන අයට කාරක සභා සාමාජිකත්වය ලබා දිය හැකිය. එහෙත් රජය සමඟ කොන්ත්‍රාත් ගනුදෙනු සිදුකරන සමිතියකට එම අවස්ථාව හිමි නොවිය යුතුය.

ජනසභාව මෙම උපමාන අනුව පත් නොවන අවස්ථාවක ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරයාට සහ ජාතික ජනසභා ලේකම් කාර්යාලයට පැමිණිලි කල හැකිය. එවිට අදාළ ග්‍රාමීය ජනසභා ලේකම්වරයා ඒ සඳහා වග උත්තර බැඳිය යුතුය.

**කාර්යයන්**

ග්‍රාමයට අදාළවන සංවර්ධන යෝජනා පිළිබඳව නිර්දේශ සහ යෝජනා පළාත් සහ මධ්‍යම රජයන් වෙත ලබා දීම, පළාත් පාලන ආයතනවල කටයුතු සඳහා ප්‍රජා සහභාගීත්වය ලබාදීම, රජයේ සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රජා දායකත්වය ලබා දීම සහ ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට අදහස් ඉදිරිපත් කිරීම මගින් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ වීම මෙම ග්‍රාමීය ජනසභාවට මූලිකව පැවරෙන කාර්යයන් වනු ඇත.

**බලතල**

ග්‍රාම සේවා වසමට අදාලව **සෑම රාජ්‍ය ප්‍රතිපත්තියක්ම ක්‍රියාත්මක කිරීමේ දී** අදාළ නිලධාරීන් කාරක සභාව විමසා ඔවුන්ගේ අදහස් සහ යෝජනා සැලකිල්ලට ගත යුතුය. කිසියම් හදිසිතත්වයකදී හෝ වැදගත්කම අතින් ඉහල තීරණයක් ගැනීමට සිදුවන අවස්ථාවක දී හදිසි මහසභාවක් කැඳවා එහි අදහස් ද විමසා අදාළ තීරණ ක්‍රියාත්මක කල යුතුය. එමෙන්ම එකී තීරණ ක්‍රියායාත්මක කිරීම සඳහා සක්‍රීය ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීමට ද කටයුතු කල යුතුය. (උදාහරණ - වසමට අදාළව  සංවර්ධනය කල යුතු ව්‍යාපෘති වල ප්‍රමුඛතාව ජන සභාව විමසා තීරණය කල යුතුය. එමෙන්ම එම ව්‍යපෘති ක්‍රියාත්මක වීමේදී නිසි ප්‍රමිතියට සිදුවන්නේ ද යන්න පිළිබඳව සුපරීක්ෂණය ජන සභාව විසින් සිදුකල යුතුය.)

මෙම සභාවට ව්‍යවස්ථානුකූලව පැවරෙන මුදල් බලතල නොමැත. මෙම සභාවට ආණ්ඩුවේ හෝ ප්‍රාදේශීය බල අධිකාරයක කොන්ත්‍රාත් ලබා ගැනීම වැනි මුදල් ඉපයීමේ ක්‍රියා සිදුකල නොහැක.

නමුත් ලාභ නොලබන පදනමින් හදිසි අවශ්‍යතා, සංග්‍රහ කටයුතු උත්සව වියදම් වැනි දේ සහ සුභ සාධක අරමුණු සඳහා සභා අරමුදලක් පවත්වාගෙන යා හැකිය. එහි වගකීම කාරක සභාව විසින් පිහිටුවන අරමුදල් කමිටුව විසින් දැරිය යුතුය.

එමෙන්ම අදාල වසමට බලපාන සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව ගැටළු මතුවන අවස්ථා වලදී අදාළ වසමේ කාරක සභාව නියෝජනය කරමින් එහි සාමාජිකයින්ට  ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට සහභාගීවමට සහ එම තීරණයන් පිළිබඳව සිය නිරීක්ෂණයන් ලබා දීමට අවස්ථාව ලැබිය යුතුය.

ජනසභාව සඳහා කාරක සභා සාමාජිකයින් ප්‍රධාන කොට පහත විෂයයන්ට අදාළව  අනුකමිටු පිහිටුවිය හැකිය. ඒ සඳහා උනන්දු ජනතාව එම කමිටු සඳහා සහභාගී කරගත හැකිය.

> ආපදා කළමනාකරණය, ග්‍රාමීය ක්‍රීඩා හා සංස්කෘතික කටයුතු, ග්‍රාමීය කෘෂිකර්මය, සත්ත්ව පාලනය සහ වෙනත් ග්‍රාමීය කර්මාන්ත, ප්‍රාදේශීය ජල මූලාශ්‍ර කළමනාකරණය සහ ආරක්ෂාව, ග්‍රාමීය කැලෑ සහ වන වැස්ම ආරක්ෂාව, ප්‍රාථමික සමථකරන ක්‍රියාවලියට අදාළ කටයුතු, ග්‍රාමීය පරිපාලන සහයක කටයුතු, සිවිල් ආරක්ෂාව (සිවිල් ආරක්ෂක කමිටුවේ කාර්යයන්), ග්‍රාමීය ආහාර සුරක්ෂිතතාව සහ ඉදිරියේදී සුදුසු යයි තීරණය කරන වෙනත් කාර්යයන්

<u>වෙනත් කරුණු</u>

කිසිඳු අයුරකින් දේශපාලන පක්ෂ ක්‍රමයක් මේ තුළ ක්‍රියාත්මක නොවිය යුතු අතර ස්වාධීන ලෙස ඉදිරිපත්වීම් සහ තෝරා ගැනීම් සිදුවිය යුතුය. දේශපාලන පක්ෂ බලපෑමෙන් සහ ග්‍රාමීය ප්‍රභූතන්ත්‍රයන්ගේ බලපෑමෙන් ස්වායත්තව සියලු පාර්ශව සඳහා සාධාරණ නියෝජයක් තහවුරු කිරීම සඳහා ග්‍රාමීය ජනසභා ලේකම්වරයා විසින් අදාළ උපමාන අනුව කටයුතු කල යුතුය.

එමෙන්ම ජාතික තලයේ ප්‍රතිපත්ති තීරණ පිළිබඳව මහජන අදහස් විමසීමේ සභාවක් බවට ද අවශ්‍යතාවය මත මෙම සභාව යොදාගැනීමට කටයුතු කලයුතුය. (මෙහිදී වික්ටර් අයිවන් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ප්‍රතිසංස්කරණ සඳහා වන ජාතික ව්‍යාපාරය වැනි මහජන අදහස් මත ගොඩනගන ජාතික තලයේ ප්‍රතිපත්තිමය සංවාද සඳහා ඉඩ ප්‍රස්ථාව හිමිවනු ඇත.)

මෙම සභා සඳහා ඩිජිටල්කරණය මත පදනම් වූ සුහුරු (SMART) තාක්ෂණික ක්‍රම හඳුන්වාදීමට කටයුතු කල යුතු අතර එමඟින් සෘජුවම E තාක්ෂණික ක්‍රමවේදයන් ඔස්සේ මහජන පෙත්සම් ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රමවේද හඳුන්වා දිය යුතුය.

එමෙන්ම සභා වල ප්‍රගතිය පරීක්ෂා කිරීම වේගවත් කිරීම සඳහා ද සභා කටයුතු පිළිබඳව සියලු තොරතුරු ඩිජිටල් තාක්ෂණය ඔස්සේ ලබා ගත හැකි ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. ජාතික ජනසභා ලේකම් කාර්යාලයට ඍජුව ඩිජිටල් තාක්ෂනය ඔස්සේ ඒ ඒ ජනසභාවල ප්‍රගතිය පිළිබඳව තොරතුරු ක්ෂණිකව ලබාගැනීමට මේ ඔස්සේ අවස්ථාව ලැබිය යුතුය.

## 10. ප්‍රාදේශීය ජනසභා කළමනාකරණ කමිටුව

- මසකට වතාවක් ප්‍රදේශීය ලේකම්වරයා ඇතුළු රාජ්‍ය නිලධාරීන් සමඟ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සියලුම ජනසභා සභාපතිවරුන් පවත්වනු ලබන රැස්වීමකි. හදිසි ආපදා තත්ත්වයක් වැනි අවස්ථාවක දී මාසික රැස්වීමට අමතර වශයෙන් ජනසභා සභාපතිවරුන්ගේ හදිසි රැස්වීම් කැඳවීමට ප්‍රා.ලේ ට හැකියාවක් ඇත. මෙම රැස්වීමේ මුලසුන ප්‍රාදේශීය ලේකම්වරයා විසින් දරනු ඇත.
- ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන සැලසුම් අධ්‍යක්ෂවරයකු විසින් රැස්වීම් වාර්තා සකස් කිරීම සහ යොමු කිරීම සිදුකල යුතුය.
- මෙම රැස්වීමේ වාර්තාවක් ජාතික ජනසභා ලේකම් කාර්යාලය වෙත එවිය යුතුය.
- එමෙන්ම අත්‍යවශ්‍ය කරුණක් සඳහා හදිසි රැස්වීමක් කැඳවන මෙන් ජනසභා සභාපතිවරුන්ට ප්‍රා.ලේ ගෙන් ඉල්ලා සිටීමට ද හැකියාව ඇත.
- **ප්‍රාදේශීය ජනසභා කළමනාකරණ කමිටුව**විසින් ජනසභාවල ප්‍රගතිය සහ ගැටළුසාකච්ඡා කරනු ලබයි.
- ඒ ඒ ජනසභා ආශ්‍රිතව පවතින නොවිසඳුණු ගැටළු (සංවර්ධන සහ ප්‍රතිපත්තිමය) ඒ ඒ විෂයය අනුව පළාත් ආණ්ඩුකාරවරයා / පළාත් ප්‍රධාන ලේකම්වරයා හෝ අමාත්‍යාංශ ලේකම්/ දිස්ත්‍රික් ලේකම්/ දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය ආයතන ප්‍රධානීන් වෙත යොමු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳව ද මෙහිදී තීරණය කල යුතුය.

## 11. ජාතික ජන සභාව

**අරමුණ**

පරිධියේ ජනතාව ජාතික ප්‍රතිපත්ති සම්පාදනය සඳහා දායක කරගැනීම

**සංයුතිය**

මුළු සාමාජික සංඛ්‍යාව 100 කි. ග්‍රාමීය ජනසභා වල කාරක සභා සාමාජිකයින්ගෙන් අවස්ථානුකූලව කැඳවනු ලබන 75 ක පිරිසක් සහ වෘත්තීය මට්ටමේ ප්‍රමාණික වියතුන්, සිවිල් සංවිධාන ක්‍රියාකාරීන්, කාන්තා සහ තරුණ ක්‍රියාකාරීන් අතුරින් කුසලතා ඇගැයීම මත කැඳවන 25 ක පිරිසකගෙන් සමන්විත වේ.

**රැස්වීම**

සෑම මසකට වරක්ම අවසාන සතියේ රැස්වේ. අවස්ථානුකූලව හදිසි තත්වයන් යටතේ විශේෂ මාතෘකා සාකච්ඡා කිරීමට රැස්විය හැකිය.

**තෝරා ගැනීම**

සභාපති - ජාතික ජන සභාවේ සභාපති තනතුර ගෞරවණීය තනතුරක් ලෙස ස්ථාපනය කරන අතර එය පාර්ලිමේන්තු සභාව විසින් ඔවුන් වෙත ඉදිරිපත් වන නාම යෝජනා මත පදනම්ව පත් කරනු ඇත. 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සිදුකරනු ඇත. **කාලය වසර 03 කි.**

**අනෙකුත් සාමාජිකයින් 100 දෙනා ස්ථිර සාමාජිකයින් නොවේ. මාසයකට වරක් සාකච්ඡා කරන කරුණු අනුව අහඹු ලෙස කැඳවනු ලබයි. ජනතා ජූරි සභාවක ස්වභාවය ගනු ඇත.**

**නිදර්ශන**

1. *සියලුම ග්‍රාමීය ජන සභා වල කාරක සභා සාමාජිකයින් එක් ඩිජිටල් දත්ත පද්ධතියක ලියාපදිංචි කරනු ලබන අතර ඔවුන් වෙත සුහුරු (smart) යෙදවුමක් මගින් සෑම මසකම ආරම්භක සතියේ දී එම මස අවසාන සතියේ ජනසභාව විසින් සාකච්ඡා කිරීමට නියමිත මාතෘකා යවනු ලබයි.*

2. *එහිදී තමාගේ විශේෂඥතාව සහ උනන්දුව අනුව එම මාතෘකාව පිළිබඳව තමන්ට අදහස් පලකිරීමට තිබේද යන්න පිළිබඳව ඔහුට හෝ ඇයට සඳහන් කිරීමට අවස්ථාව හිමිවේ. එය ප්‍රධාන දත්ත පද්ධතිය වෙත සටහන් වන අතර එසේ අවස්ථාව ඉල්ලා සිටින පිරිස අතුරින් අහඹු ලෙස දිස්ත්‍රික් පදනමින් 70 ක පිරිසක් එම මාසයේ ජන සභාවට සහභාගීවන පරිධියේ ජනතා නියෝජිත පිරිස ලෙස තෝරා ගනු ලබයි.*

3. *වෘත්තීය සංවිධාන සහ සිවිල් ක්‍රියාකාරීන් අතුරින් අයදුම්පත් කැඳවා ඔවුන්ගේ විශේෂඥතාව අනුව වර්ගීකරණය කරන ලද දත්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලබන අතර ඔවුන් අතුරින් අහඹු ලෙස*

*තෝරා ගන්නා ලද 30 ක පිරිසකට ද සෑම මාසයකම ජාතික ජන සභාව සඳහා සහභාගී වීමට අවස්ථාව හිමිවේ.*

**ක්‍රියාකාරීත්වය**

මෙම ජාතික ජනසභාවේ රැස්වීම් වාර්තා අදාළ විෂයභාර අමාත්‍යවරයා වෙත සහ ආංශික අධීක්ෂණ කමිටු සභාපතිවරයා වෙත ජාතික ජන සභාවේ සභාපතිවරයා විසින් යොමු කරනු ලැබේ. ඒ අනුව ප්‍රතිපත්ති සම්පාදනයේ දී ඔවුන් විසින් ඒ පිළිබඳව සැලකිල්ලට ගත යුතු අතර පාර්ලිමේන්තුවේ නීති සම්පාදන ක්‍රියාවලිය තුළ එම අදහස් සඳහා නිසි වටිනාකමක් ලබා දිය යුතුය.

## 12. ජාතික ජන සභාවේ සභාපතිවරයා

ජාතික ජන සභාවේ සභාපතිවරයා යනු ප්‍රොටෝකෝලයන්ට අනුව පිහිටුවනු ලබන ගරු තනතුරක් වේ. මෙම සභාපතිවරයා පාර්ලිමේන්තු සභාව (22 වන සංශෝධනයෙන් පසුව ආණ්ඩුක්‍රමව්‍යවස්ථා සභාව) විසින් පත්කළ යුතුය.

සභාපතිවරයාගේ කාර්යයන් සහ බලතල

a. ජාතික ජන සභාව කැඳවීම, සභාවාර මෙහෙයවීම සහ සභාවාර සභාවේ යෝජනාව පරිදි කල් තැබීම
b. ජාතික ජන සභාව වෙත ඉදිරිපත්වන මහජන පෙත්සම් සලකා බලා පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කිරීම පිණිස කථානායකවරයා ගේ අවධානයට යොමු කිරීම
c. පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරකසභා ක්‍රමය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍යතාවය පරිදි ජාතික ජන සභාව සමඟ අවශ්‍ය සම්බන්ධීකරණයන් සිදු කිරීම සහ ආංශික අධීක්ෂණ කාරක සභා සඳහා ජාතික ජන සභාවේ සාමාජිකයින් සුදුසු පරිදි සම්බන්ධ කිරීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
d. ජාතික ජන සභාවේ යෝජනා සහ ප්‍රකාශනයන් සම්මත වූ පසු ඊට අත්සන යොදා සහතික කිරීම.
e. ජාතික ජන සභාවේ යෝජනා සහ ප්‍රකාශනයන් උත්තරීතර පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කිරීම සඳහා කථානායකවරයා වෙත යොමු කිරීම.
f. පාර්ලිමේන්තුව සහ ජාතික ජන සභාව අතර සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.

## 13. ජාතික ජන සභාවේ කාර්යයන් සහ බලතල

a. පාර්ලිමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ජනතා පරාමාධිපත්‍ය වඩාත් ශක්තිමත් කිරීම සඳහා සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන මණ්ඩලයක ස්වරූපයෙන් ද ජනතා පූරියක ස්වරූපයෙන් ද කටයුතු කිරීම.

b. සෑම මාසයකම අවම වශයෙන් එක් දිනක් ජාතික ජන සභාව කැඳවිය යුතුය.

c. දූෂණය පිටු දැකීම, පාරදෘශ්‍යභාවය වර්ධනය කිරීම සහ රාජ්‍ය අංශයේ සඵලදායීබව සහ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම පිණිස නව්‍යතාවයන් යෝජනා කිරීමට මහජනතාවට අවස්ථාව ලබා දීම .

d. කිසියම් විශේෂ කරුණක් පිළිබඳව ජාතික ජන සභාවේ මතය විමසීමට ජනාධිපතිවරයාට අවශ්‍ය වන අවස්ථාවක ඒ බව ජාතික ජන සභාවේ සභාපතිවරයා වෙත දැන්වීමෙන් අනතුරුව ජන සභාවේ සභාපතිවරයාට සභාවේ හදිසි කැඳවීමක් සිදුකල හැකිය. ඊට අමතරව පාර්ලිමේන්තුවේ හදිසි පනතක් විවාදයට ගන්නා විට ඒ බව කථානායකවරයා විසින් ජාතික ජන සභාවේ සභාපතිවරයා වෙත දැනුම් දිය යුතු අතර එවන් අවස්ථාවකද හදිසි කැඳවීමක් සඳහා ජාතික ජන සභාවේ සභාපතිවරයාට බලය ඇත.

e. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන විශේෂ පනත් සඳහා නිරීක්ෂණ ලබා දීම.

f. පාර්ලිමේන්තුව වෙත නව පනත් සඳහා යෝජනා ලබා දීම.

g. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු ප්‍රශ්න සභාපතිවරයා මගින් කථානායකවරයා වෙත ඉදිරිපත් කිරීම

h. විදේශ ගිවිසුම් සහ වෙනත් ජාතික වැදගත්කමකින් යුතු ප්‍රතිපත්තිමය යෝජනා පිළිබඳව නිරීක්ෂණ ලබා දීම.

## 14. ජාතික ජනසභා ලේකම් කාර්යාලය පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීම

1. මෙය පූර්ණ ස්වාධීන ආයතනයක් ලෙස පිහිටුවීමට යෝජනා කරනු ලබයි.

2. යෝජිත ජනසභා පිහිටුවීමට ප්‍රථම 'ජාතික ජනසභා ලේකම්කාර්යාලය ' කැබිනට් පත්‍රිකාවක් මගින් පිහිටවිය යුතුය.

3. පසුව ජනසභා පනත තුළින් එම ආයතනය ව්‍යවස්ථාපිතව පිහිටුවීමට යෝජනා කරනු ලබයි.
4. එමගින් ජනසභා ස්ථාපනයට අදාලව කටයුතු කිරීම සහ ස්ථාපනය කිරීමෙන් අනතුරුව ඒවායේ කටයුතු විධිමත්ව සිදුවන්නේ දැයි නියාමනය සහ අධීක්ෂණය කිරීම, පර්යේෂණ සහ සංවර්ධනය මගින් වැඩි දියුණු කිරීමට යෝජනා කිරීම,පරිපාලන කටයුතු සහ අනෙකුත් මෙහෙයුම් කටයුතු සම්බන්ධීකරණය කල යුතුය.

මේ අනුව පළමුව ජනසභා ලේකම් කාර්යාලය පිහිටුවීම යෝජිත ජනසභා පිහිටුවීමට ප්‍රථමව කඩිනමින් සිදුකල යුතුය.

## 15. ජාතික ජනසභා ලේකම් කාර්ලයාලයේ කාර්යයන් හා බලතල

I. ජනසභා පිහිටුවීමට ප්‍රථමව එම පනත සැකසීම සඳහා මීට ඉහත ඉදිරිපත් කර ඇති යෝජනා සහිත මූලික සංකල්ප පත්‍රිකාව මත පදනම්ව විවිධ පාර්ශවයන් සමඟ වැඩිදුර සාකච්ඡාවන් සිදු කරමින් පනත සැකසීම සඳහා කටයුතු කිරීම

II. පනත සකසා කැබිනට් මණ්ඩලය හරහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ජනසභා පනත සම්මත වූ පසුව එම පනත ප්‍රකාරව ජනසභා පිහිටුවීමට අදාළව පරිපාලනමය කටයුතු සිදු කිරීම සහ සම්බන්ධීකරණය

III. ජනසභා පිහිටුවීමෙන් අනතුරුව සභාවල නිසි පරිදි කටයුතු සිදුවන්නේද යන්න නිරීක්ෂණය, අධීක්ෂණය සහ ප්‍රගති සමාලෝචනය කිරීම මගින් දුර්වලතා මඟ හරවා ගැනීම සඳහා අදාළ අංශ වෙත නියෝග කිරීම

IV. ජනසභා ක්‍රමය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදුකිරීම

V. ජනසභා ක්‍රමය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම, ජනසභා ක්‍රමය නියාමනය සහ අධීක්ෂණය, ජනසභා ක්‍රමය නිර්දේශපාලනීකරණය (දේශපාලන පක්ෂ ක්‍රමයෙන් බැහැරව ස්වාධීනව පවත්වාගැනීම) කිරීම, ස්වාධීනතාව ආරක්ෂා කිරීම සහ ප්‍රභූවාදයේ ආධිපත්‍යට නතුවීම වැළැක්වීම ( ඒ ඒ ප්‍රදේශවල ක්‍රියාත්මක කුමනාකාරයේ හෝ ප්‍රභූවාදයක ආධිපත්‍යට නතුවීම වැළැක්වීම) සඳහා උපමාන නිකුත්කිරීම

VI. අන්තර්ජාතික නියෝජිතායතන සමඟ කටයුතු කරමින් මෙම ක්‍රියාවලිය සංවර්ධනය සඳහා අවශ්‍යකටයුතු සිදුකිරීම

VII. ඩිජිටල්කරණය මගින් සභාවල කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය පහසුකම් යෝජනා කිරීම සහ හඳුන්වාදීම

VIII. ග්‍රාමීය ජනසභා ලේකම්වරුන් පුහුණුකිරීම, අධීක්ෂණය සහ නියාමනය

IX. ඉදිරියේ දී ඉදිරිපත්වන පනත මගින් ජාතික ජනසභා ලේකම්වරයා වෙත පැවරී ඇති විශේෂ බලතල ක්‍රියාත්මක කිරීම

X. ජාතික ජන සභාවේ කටයුතු සඳහා අවශ්‍ය පරිපාලනමය සහය ලබා දීම

**<u>ජාතික ජනසභාලේකම් කාර්යාලය විසින් සංවිධානය කරනු ලබන නියමු ව්‍යාපෘති</u>**

ජනසභා ක්‍රමය විධිමත්ව ස්ථාපනය කිරීම සඳහා ජනසභා පනත සකස් කිරීමට ප්‍රථම මෙම සංකල්ප පත්‍රිකාවේප්‍රායෝගික භාවිතය පිළිබඳවඅත්තදැකීමක් ලබා ගැනීම සඳහා නියමු ව්‍යාපෘතිසංවිධානය කිරීමට ජාතික ජනසභාලේකම් කාර්යාලය විසින් කටයුතු කිරීම අත්‍යාවශ්‍යවේ.

ඒ අනුව දිස්ත්‍රික් 25 තුළ තෝරාගත්ප්‍රාදේශීයලේකම්කොට්ඨාශ25 ක මෙම 'ග්‍රාමීය ජනසභා ක්‍රමය' අත්හදා බැලීම සඳහා නියමු ව්‍යාපෘතිසංවිධානය කිරීම වඩාත් සුදුසුවේ. එම නියමු ව්‍යාපෘති වල අත්දැකීම මත පදනම්වමෙමමූලික සංකල්ප පත්‍රිකාව තවදුරටත්සංවර්ධනය කිරීමට අවස්ථාව ඇත.
එමෙන්ම ජාතික ජන සභාව කැඳවීම සඳහා අහඹුනියැදි ක්‍රමයට ග්‍රාමීය ජනසභාසාමාජිකයින් අතුරින් සාමාජිකයින් තෝරාගැනීමපිළිබඳව ද අත්තහදා බැලීම් වැඩසටහන් ජාතික ජනසභා කාර්යාලයට මේ අනුව සිදු කල හැකි වනු ඇත.

## 16. සාරාංශය

ජනසභා පිළිබඳව සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය විසින් සකස් කරන ලද මූලික සංකල්ප පත්‍රිකාව පදනම් කරගෙන විවිධ විද්වත් වෘත්තික ප්‍රජාවන් සහ මේ පිළිබඳව උනන්දුවක් දක්වන කණ්ඩායම් වල සහභාගීත්වයෙන් සාකච්ඡා වට ගණනාවක් පවත්වා මූලික සංකල්ප පත්‍රිකාව සංශෝධනය කරමින් අවසානයේ සියලු දෙනාගේ අදහස් මත ගොඩනැගුන වඩා ප්‍රයෝගික යෝජනාවක් ලෙස මෙම යෝජනාව ඉදිරිපත් කරනු ලබයි. මේ තුළින් සෑම ග්‍රාම සේවා වසමක් සඳහාම ජනසභාවක් පිහිටුවීමටත් ඒ සඳහා සභාපතිවරයෙක් සහ කාරක සභාවක් ගම තුළින් පත් කරගැනීමටත් යෝජනා කර සිටියි. එමෙන්ම එසේ පත්වන කාරක සභා සාමාජිකයින් අතුරින් තරුණ, කාන්තා සහ වැඩිහිටි නියෝජනයන් නිසි පරිදි තහවුරුවන පරිදි  සහ ජාතිකත්වය මත කිසිඳු නොසලකා හැරීමක් සිදු නොවන පරිදි ජාතික ජන සභාවක් කැඳවීමට යෝජනා කරන අතර එසේ කැඳවන අවස්ථා වලදී අහඹු නියැදි ක්‍රමයක් මගින් 75% ක සාමාජිකයින් ප්‍රමාණයක් ග්‍රාමීය කාරක සභා සාමාජිකයින් අතුරින් තෝරා ගැනීමටත් ඉතිරි 25% ක ප්‍රමාණය වෘත්තිකයින්, වෘත්තීය සංගම් සහ ජාතික මට්ටමේ  සිවිල් සහ දේශපාලන ක්‍රියාකාරීන් අතුරින් අහඹු නියැදි ක්‍රමයකට තෝරා ගැනීමටත් යෝජනා කර ඇත. මෙම ජාතික ජන සභාව තුළින් ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සක්‍රීය මහජන සහභාගීත්වයක් තහවුරු කිරීමට හැකි වනු ඇත. මෙම ජාතික ජන සභාවේ අදහස් පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කමිටු වෙත සම්බන්ධීකරණය කිරීම ජාතික මහජන සභාවේ සභාපතිවරයා මගින් සිදු කිරීමට යෝජිතය. මේ තුළින් වඩාත් සක්‍රීය මහජන

සහභාගීත්වයක් තුළින් තිරසර රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියක් තහවුරු කිරීමටත් එකී රාජ්‍ය ප්‍රතිපත්ති සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සක්‍රීය ප්‍රජා පුරවැසි සහභාගීත්වයක් ඇති කිරීමටත් අපේක්ෂා කරනු ලබයි.

**කරු ජයසූරිය**

**සභාපති**

**සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය**

**2022.09.21**